## 2018.04.27 වන දින ප.ව. 2.30 ට සීතාවක ප්‍රාදේශීය සභා කමිටු ශාලාවේදී පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීමේ වාර්තාව.

**සහභාගි වූ .**

1. ගරු කාරක සභා සභාපති - ජී. ජයන්ත රෝහණ මැතිතුමා
2. ගරු කාරක සභික - එස්.ඩී. මංජුල ප්‍රදිප් කුමාර් මැතිතුමා.
3. ගරු කාරක සභික - චන්දන මුදුන්කොටුව මැතිතුමා.
4. ගරු කාරක සභික - කේ.ඒ විමල් ප්‍රසන්න මැතිතුමා.
5. ගරු කාරක සභික - ලියනගේ චන්දන කුමාර මැතිතුමා.
6. ගරු කාරක සභික - යසරු දෙවන්මිණ රාජපක්ෂ මැතිතුමා.
7. ගරු කාරක සභික - ජයන්ත රණවක මැතිතුමා.
8. ගරු කාරක සභික - මංජුල ධම්මික වීරරත්න මැතිතුමා.
9. ගරු කාරක සභික - එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා.
10. ගරු කාරක සභික - සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා.
11. ගරු කාරක සභික - උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා.
12. ගරු කාරක සභික - ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා.
13. ගරු කාරක සභික - පී.ඒ ප්‍රදීප් කුමාර් මැතිතුමා.
14. ගරු කාරක සභික - ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා.
15. ගරු කාරක සභික - එස්. චන්දන සූරියආරච්චි මැතිතුමා.

**සහභාගි නොවූ.**

1.ගරු කාරක සභික - ගයාන් දුමින්ද චන්ද්‍රසිරි මැතිතුමා.

2. ගරු කාරක සභික - පුස්සැල්ලගේ අමල් නිශාන්ත සිල්වා මැතිතුමා.

**සහභාගි වූ නිලධාරීන්**

1.ලේකම් - කේ.ඒ චන්දන පද්මසිරි මයා.

2.ප්‍රධාන කළමනාකරණ සහකාර - කේ.ඩී. සන්ධ්‍යා මාලනී මිය.

3. වැඩ අධිකාරී - ජයන්තා ජල්තොටගේ මිය.

4.කාර්යභාර නිලධාරී - පාදුක්ක - ඩී.සී.ජේ. අමරසිංහ මිය.

5.කාර්යභාර නිලධාරී - හංවැල්ල - සුමනා ජයසූරිය මිය.

6.කාර්යභාර නිලධාරී - කහහේන - චමරි පද්මලතා මිය.

7. තාක්ෂණ නිලධාරී - පාදුක්ක - ඩබ්.එම්.එන්.පී. දිවිගල්පිටිය මිය.

8. සංවර්ධන නිලධාරී -ආර්.පී.එන්.පී. ජිනදාස මයා.

9. සංවර්ධන නිලධාරී - ඉෂානි කමලිකා මිය.

10.කළමනාකරණ සහකාර - සැපයුම් - දිපානි වික්‍රමසිංහ මිය.

11.කළමනාකරණ සහකාර - ගිණුම් - ඩබ්.ඩී.ඩී.පී. ජයසේකර මිය.

12. කළමනාකරණ සහකාර - ගිණුම් - එස්.ඩී. සිරෝෂනී මිය.

13.ආදායම් පරිපාලක - කොස්ගම - එච්.ඒ.ඩී.එස්. ප්‍රියන්ත මයා.

14.ආදායම් පරිපාලක - පාදුක්ක - වී.පී.සී.ඒ.කේ. පෙරේරා මයා.

ගරු සභාපතිතුමා විසින් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව සඳහා පැමිණ සිටි සියළුදෙනා සාදරයෙන් පිළි ගැනීමෙන් අනතුරුව කාරක සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 01.ලිපි ලේඛන සලකා බැලීම.

01.2018 රාජ්‍ය වෙසක් උත්සවය වෙනුවෙන් සුරාසැල්, මස් මාංශ අලෙවි සැල්, සතුන් මරණ ස්ථාන, රේස් බුකි, කැසිනෝ ශාලා හා සමාජශාලා 2018 අප්‍රේල් මස 29 හා 30 යන දෙදින තුළ වසා තැබීම වෙනුවෙන් දැනුවත් කිරිම සඳහා LGD/05/08/පොදු පළාත් පාලන කොමසාරිස් (බ.ප) වෙනුවට පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි විසින් යොමු කරන ලද ලිපිය අනුව අදාල ක්‍රියාත්මක විම් සඳහා මේ වන විට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි - හංවැල්ල, පාදුක්ක, හා උප කාර්යාල හතරෙහි කාර්යභාර නිලධාරින් වෙත ලිපි මගින් දැනුම් දී ඇති බව ගරු සභාපතිතුමා විසින් කමිටුව දැනුවත් කරන ලදී.

02. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හංවැල්ල විසින් 2018.03.28 දිනැතිව දිනැතිව තුන්නාන සායනයේ පසුගිය මස ජල බිල්පත ඉහළ යාමට එම කාලය තුළ වූ අළුත්වැඩියා කටයුතු හා අසල ඇති පෙර පාසලක් සඳහා සායනයේ ජල මාර්ගයෙන්ම ජලය ලබා ගැනීම හේතු වී ඇති බව සඳහන් කරමින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, පෙර පාසල ලාභ ඉපයීමේ අරමුණින් පවත්වාගෙන යන පෞද්ගලික ආයතනයක් බැගින් ඒ සඳහා වෙනම ජල මීටරයක් සවි කර ගන්නා ලෙස පෙර පාසල දැනුවත් කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

03. රාජකාරි වේලාවට අමතරව ඉටු කරන ලද අත්‍යවශ්‍ය රාජකාරි කටයුතු වෙනුවෙන් වූ එක් මසකට අදාල වන අතිකාල පැය ගණන් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් ප්‍රධාන කාර්යාලය, හංවැල්ල උප කාර්යාලය, පාදුක්ක උප කාර්යාලය, කොස්ගම උප කාර්යාලය හා කහහේන උප කාර්යාලය යන ආයතන වල සේවය කරනු ලබන නිලධාරින් හා සේවකයින් වෙනුවෙන් පහත තනතුරු/ නම් ඉදිරියෙන් දක්වා ඇති අතිකාල පැය ගණන් අනුමත කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

| | |
|---|---|
| 01. කළමනාකරණ සහකාර (ලේකම්) | - දින 08 |
| 02. සංවර්ධන නිලධාරි | - පැය 80 |
| 03. පුස්තකාලයාධිපති | - පැය 80 |
| 04. තාක්ෂණ නිලධාරි | - දින 08 |
| 05. කළමනාකරණ සහකාර | - පැය 80 |
| 06. ආදායම් පරික්ෂක | - දින 08 |
| 07. ආදායම් පරිපාලක | - දින 08 |
| 08. සෞඛ්‍ය/ කර්මාන්ත පරිපාලක | - දින 08 |
| 09. පුස්තකාල සහායක | - පැය 80 |
| 10. ඖෂධ සංයෝජක | - පැය 80 |
| 11. රියදුරු | - පැය 150 |
| රියදුරු (රියදුරු - ලේකම් ) | - පැය 200 |
| රියදුරු (රියදුරු - සභාපති) | - පැය 200 |
| රියදුරු (ජේ.සී.බී. රථය) | - පැය 200 |
| 12. මුරකරු | - පැය 120 |

13. කාර්යාල කාර්ය සහායක ( ආර්.එල් ස්වර්ණලතා) - පැය 130
14. කාර්යාල කාර්ය සහායක - පැය 80
15. විදුලි කම්බිකරු - පැය 80
16. ආදාහනාගාර ක්‍රියාකරු/සහායක - පැය 100
17. වැඩ ක්ෂේත්‍ර කම්කරු - පැය 80
18. වැඩ ක්ෂේත්‍ර කම්කරු (මුර සේවය) - පැය 120
19. වැඩ ක්ෂේත්‍ර කම්කරු (එච්.පී.එස්. පද්මකුමාර) - පැය 200
20. සෞඛ්‍ය කම්කරු - පැය 150
21. සෞඛ්‍ය කම්කරු (එච්.එස්.ප්‍රේමජයන්ත- හංවැල්ල පොදු වැසිකිළිය) - පැය 200

04.සීවලී වත්තේ පදිංචි ජනතාව පිළිබඳව අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් කර ඇති ඉල්ලීමකට අනුව සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හංවැල්ල විසින් 3/3/ විවිධ හා 2018.04.04 දිනැතිව සීවලී වත්ත ඉඩම් වල පදිංචිකරුවන් සඳහා හිමිකම් සහතික පත්‍රයක් ලබා දී ඇති බව වාර්තා කර ඇති බවත් එම පදිංචිකරුවන් හට ඉදිරියේදී බලපත්‍රයක් ලබා දිමේ හැකියාවක් පවතිද යන්න හා සභා දේපලක්ද යන්න විමසමින් යොමු කරන ලද ලිපියට තාක්ෂණ නිලධාරි විසින් සභා දේපලක් බවට සඳහන් කරමින් ඉදිරිපත් කළ වාර්තාවද සැලකිල්ලට ගනිමින් එම පදිංචිකරුවන් සඳහා ඉදිරියේදි බලපත්‍ර ලබා දිමේ හැකියාවක් ඇති බැවින් ඒ සඳහා ඉදිරි මහා සභාවට යෝජනාවක් ඉදිරිපත් කර ඒ බව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - හංවැල්ල වෙත දන්වා යැවීම සුදුසු බවට තීරණය කරන ලදී.

05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා මගින් 2018.04.20 දිනැතිව සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිතිය, පාදුක්ක විසින් පාදුක්ක සණස කාර්යාලය සඳහා පාදුක්ක සේවා පියස ගොඩනැගිල්ලේ ග්‍රාම සේවක කාර්යාලය පිහිටා ඇති ගොඩනැගිල්ලේ උඩුමහල ලබා ගැනීම යන හිසින් යුතුව යොමු කරන ලද ලිපිය සලකා බැලු කාරක සභාව, පළමුව උඩුමහල සකස් කිරිම සඳහා වු සැලැස්ම හා ඇස්තමේන්තුව සකස් කර ඉන්පසු මේ සම්බන්ධයෙන් තීරණයක් ගත යුතු බවට තීරණය කරන ලදී.

06.පාදුක්ක, කොළඹ පාර, අංක 39 හි එක්සත් වෙළද ව්‍යාපාරිකයින්ගේ සංගමයේ සභාපති හා ලේකම්ගේ අත්සනින් යුතුව 2018.04.03 දිනැතිව පාදුක්ක නගරයට ආලෝකයක් ලබා දුන් පාදුක්ක ප්‍රජා ශාලාව සීතාවක ප්‍රාදේශීය සභාවේ ගරාජයක් බවට පත් වී ඇති බවත් එය නැවත ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි සකස් කර දෙන ලෙස ඉල්ලා යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කළ ලේකම්තුමා, එම ප්‍රජා ශාලාව සම්පුර්ණයෙන්ම අළුත්වැඩියා කර ඉදිරියේදී එළිමහන් කියවීමේ ශාලාවක් බවට සංවර්ධනය කිරිමට අවශ්‍ය මුලික සංවර්ධන කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

07. නෙළුවත්තුඩුව පල්ලිය අසලින් ඇති ගම ඇතුළට නව මාර්ගය ඉදිකර ගැනීම යන හිසින් යුතුව ප්‍රදේශවාසින්ගේ අත්සනින් යුතුව 2018.03.27 දිනැතිව වග, නෙළුවත්තුඩුව, පල්ලිය පාර, නො. 94/7 හි පදිංචි එම්.ඒ.ඩී. තරංග රොමේෂ් මයා විසින් ගරු බස්නාහිර පළාත් සභා මන්ත්‍රී මහේෂ් අල්මේදා මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් රූපසිංහ මැතිතුමාටද පිටපත් සහිතව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් සලකා බැලු කාරක සභාව, මේ මාර්ගය ඉදි කරදීම සම්බන්ධයෙන් අදාල පාර්ශව සමග සාකච්ඡා කිරිමට තීරණය කරන ලදී.

08.පාදුක්ක, අරුක්වත්ත, අංක 488/ඒ හි පදිංචි ඒ.එම්.ඒ. මොහොමඩ් මයා 2018.04.27 දිනැතිව කොස්ගම සතිපොල අංක 42 කුකුල් මස් කඩය දැනට ටෙන්ඩර් දමා ඇති මුදලට වඩා වැඩි මුදලකට හෝ දිර්ඝ කාලින බදු පදනම මත ලබා දීමට කටයුතු සලසා දෙන ලෙසත් ඒ සඳහා සභාව විසින් ලබා දෙනු ලබන ඕනෑම කොන්දේසියකට යටත් වීමට කැමති බවත් සඳහන් කරමින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, ඒ පිළිබඳව දිර්ඝ වශයෙන් සාකච්ඡා කිරිමෙන් පසු සභා සතු දේපලක් වාර්ෂික බදු දීමක් මිස දිර්ඝකාලින බදු දීමක් කර නොහැකි බැවින් කොස්ගම සතිපොල අංක 42 කුකුල් මස් කඩය, ස්ථානයේ කිසිදු වෙනසක් සිදු නොකර පවතින ආකාරයෙන් සතිපොළ පැවැත්වෙන දිනයන්හිදී පමණක් කුකුල් මස් වෙළදාම් කිරිමට හැකි වන පරිදි යන කොන්දේසි මත නැවත මෙම වර්ෂය සඳහා ටෙන්ඩර් කැඳවීමට තීරණය කරන ලදී.

09.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා මගින් පාදුක්ක, ගලගෙදර, රණවිරු මාවත ප්‍රදේශවාසින් විසින් එම ප්‍රදේශයට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් පානීය ජල පහසුකම් ලබා දීම සඳහා පළාත් සභා ප්‍රතිපාදන මගින් මුදල් වෙන් කර තිබුණද ජල නල එලීම සඳහා මාර්ගයේ කාණු කැපීමට මුදල් වෙන් වී නොමැති බවත් ඒ සඳහා අධික මුදලක් වැය වන බැවින් ඔවුනට එම මුදල දරා ගත නොහැකි බවත් සඳහන් කරමින් 2018.04.24 දිනැතිව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් දිර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කළ කාරක සභාව, කාණු කැපිමේ කාර්යය සිදු කරලීමේ ඉදිරි පියවර ගැනීම සඳහා ප්‍රදේශවාසින්ගේ අත්සන් සහිත ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස දන්වා යැවීම සුදුසු බවට තීරණය කරන ලදී.

10. කොස්ගම උප කාර්යාලයේ සේවයේ නියුතු කේ.එම්. රසිකා සෙව්වන්දි මිය දේපල ණය ලබා ගැනීම සම්බන්ධවයි යන හිසින් යුතුව 2018.04.02 දිනැතිව යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් සලකා බැලූ කාරක සභාව, අනුමැතිය ලබා දීම සඳහා ඉදිරි මහා සභාව වෙත සභා යෝජනාවක් මගින් ඉදිරිපත් කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

11. අංක 12 දිද්දෙණිය කොට්ඨාසයේ නිරිපොල ග්‍රාම නිලධාරි වසමට අයත් සුමුදු සුවහස් මල් සංගමය විසින් 2014 වර්ෂයේ 2017 වර්ෂය දක්වා සීතාවක ප්‍රාදේශීය සභා හංවැල්ල උත්සව ශාලාව ඉදිරිපිට සිය අලෙවි කටයුතු සිදු කළද 2017 වසරේ සිට එය තහනමට ලක් වූ බවත් නැවතත් එම ස්ථානයේ අලෙවිකරණ කටයුතු සිදු කිරිම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා සුමුදු සුවහස් මල් සංගමයේ සභාපතිතුමාගේද ඉල්ලීම් ලිපියක් සමගින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ඩී. ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය විසින් 2018.04.18 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, හංවැල්ල උත්සව ශාලාවේ උත්සවයන් පැවැත්වෙන දින වලදී හැර අනෙක් දිනයන් සඳහා පමණක් උත්සව ශාලාව ඉදිරිපිට ස්ථානය මුදල් අයකර සුමුදු සුවහස් මල් සංගමයේ අලෙවිකරණ කටයුතු සඳහා ලබා දීමට තීරණය කරන ලදී.

12. මාසික වැටුප් හා දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත සෑම මසකම දින 15 කට වරක් යැවිය යුතු එකතු කළ අගය මත ගෙවිය යුතු බද්ද, ජාතිය ගොඩ නැගිමේ බද්ද, මුද්දර හා උපයන විට ගෙවීම් සඳහා වන බදු ප්‍රමාදයකින් තොරව ගෙවීමට සිදු වන බැවින් එම ගෙවීම් සඳහා රු. 7,500,000.00 ( ලක්ෂ හැත්තෑ පහක) උපරිමයකට යටත්ව ආවරණ අනුමැතිය යටතේ ගෙවීම් සිදු කිරිම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා ගිණුම් කළමනාකරණ සහකාර එස්.ඩී. සිරෝෂනී මිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, අනුමැතිය ලබා දීම සඳහා ඉදිරි මහා සභාව වෙත සභා යෝජනාවක් මගින් ඉදිරිපත් කිරිමට තීරණය කරන ලදී.

13. පාදුක්ක සතිපොළ බදුකරු වන පාදුක්ක, ගලගෙදර, දෙල්ගහවත්ත, අංක 50/5 හි පදිංචි චන්ද්‍රිකා බන්දුමතී මිය විසින් පෙර අවස්ථාවලදී පාදුක්ක සතිපොළ අවට පදික වෙළඳුන්ගෙන් මුදල් පොළ බදුකරු විසින් එකතු කරනු ලැබුවද මෙවර එම අවස්ථාව අහිමි වීමෙන් වන අපහසුතාවයන් හා ඒ සඳහා නැවත අවස්ථාව ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා 2018.04.23 දිනැතිව යොමු කරන ලිපිය සම්බන්ධයෙන් සලකා බැලූ කාරක සභාව, මෙම වර්ෂයේ පොළ ටෙන්ඩර් කර ඇත්තේ සතිපොළ භූමිය තුළ ඇති වෙළඳ කුටි සඳහා පමණක් වන අතර සතිපොළ භූමියෙන් බැහැරව වෙළඳාමේ යෙදෙන පදික වෙළඳුන්ගෙන් අදාල ගාස්තු ප්‍රාදේශීය සභාව මගින් එකතු කරන ලද බව ලේකම්තුමා විසින් කාරක සභාවට පැහැදිලි කරන ලදී. ඒ අනුව සතිපොළ බදුකරුගේ ඉල්ලීම ඉටු කළ නොහැකි බවට කාරක සභාව තීරණය කරන ලදී.

14.පාදුක්ක සතිපොළ එළු කුකුල් මස් කඩයේ බදුකරු වන පාදුක්ක, ජයන්ති මාවත, අංක 329 හි පදිංචි අජිත් චන්දන අමරතුංග මයා විසින් පාදුක්ක සතිපොළෙහි පවත්වාගෙන යනු ලබන එළු කුකුල් මස් කඩය නිසා තම වෙළඳසැල පවත්වාගෙන යාමට අපහසු තත්වයක් උද්ගත වී ඇති බවත් සඳහන් කරමින් 2018.04.20 දිනැතිව යොමු කරන ලද ලිපිය හා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පාදුක්ක සතිපොළෙහි මෙහෙයුම් කටයුතු සීතාවක ප්‍රාදේශීය සභාවට ලබා දෙන අවස්ථාවේදී ලබා දුන් වෙළඳුන්ගේ නාම ලේඛනය පරිදි අනු අංක 293 යටතේ කුකුල් මස් කඩය සඳහා හා අනු අංක 294 යටතේ එළු කුකුල් මස් කඩය සඳහා පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් සඳහන්ව ඇති බැවින් එම වෙළඳාම සම්බන්ධව ගැටලුවක් නොමැති බව සඳහන් කරමින් නාගරික සංවර්ධන අධිකාරියෙන් නිකුත් කල ලිපි වල පිටපත්ද සමගින් ආදායම් පරිපාලක පාදුක්ක විසින් ඉදිරිපත් කළ වාර්තාව සම්බන්ධයෙන්ද සාකච්ඡා කළ කාරක සභාව, ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් කඩ කාමර ලබා දී ඇති ආකාරය පිළිබඳව විමසා තීරණයක් ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

15.පොල්පිටිය - පන්නිපිටිය ද.වො. 220 නව විදුලි සම්ප්‍රේෂණ මාර්ග පද්ධතිය මංවර හෙළි කිරීම ව්‍යාපෘතියට අදාලව විදුලි රැහැන් පද්ධතිය ඉදිකිරීමේදී සීතාවක ප්‍රාදේශීය සභාවට අයත් කඩුගොඩ, හීන්පැන්දලම පොදු සුසාන භූමියේ පිහිටි ඇති (කජු අගල් 66 ගස් 02, කජු අගල් 63 ගස් 01, කජු අගල් 30 ගස් 01, කජු අගල් 24 ගස් 01, කජු අගල් 16 ගස් 02, ඊරිය අගල් 22 ගස් 01, ඊරිය අගල් 12 ගස් 01, හික් අගල් 20 ගස් 01, වල් දෙල් අගල් 54 ගස් 01, කොස් අගල් 96 ගස් 01, වල් රබර් අගල් 40 ගස් 01 ) ගස් කපා ඉවත් කර ගන්නා ලෙස දන්වමින් ලංකා විදුලිබල මණ්ඩලය විසින් එවා ඇති ලිපිය හා සභාව සතු සුසාන භූමිය තුළ ඇති මෙම ගස් විදුලි පද්ධතිය ගමන් ගන්නා මාර්ගය හරහා ඇති බැවින් කපා ඉවත් කිරීම සුදුසු බව සඳහන් කර තාක්ෂණ නිලධාරි ඉදිරිපත් කරන ලද වාර්තාවද සැලකිල්ලට ගෙන ඉහත සඳහන් ගස් සියල්ල මිල ගණන් කැඳවා කපා ඉවත් කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

16.LGD/10 A/4/ DEF.BUDCOL/2018 හා 2018.04.06 දිනැතිව පළාත් පාලන කොමසාරිස් (බ.ප.) විසින් 2018 වර්ෂය සඳහා ආදායම් එකතු කර ගැනීම සම්බන්ධයෙන් ලබා දෙන ලද ඉලක්කය මත පිහිටා ආදායම් අය කර ගැනීමට කටයුතු කරන ලෙසත් දිස්ත්‍රික් විගණන රැස්වීමේදී මෙම ඉලක්ක ළඟා කර ගැනීම පිළිබඳ සමාලෝචනය කරන බවත් සඳහන් කරමින් යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් සාකච්ඡා කළ කාරක සභාව, මේ සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක, ආදායම් පරිපාලක, විෂය භාර නිලධාරින් යන ඒ හා සම්බන්ධ වන සියළු දෙනා දැනුවත් කිරීමටත් ඒ පිළිබඳව අධීක්ෂණ කටයුතු සිදු කිරීමට අභ්‍යන්තර විගණන නිලධාරි වෙත පැවරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

17. ගිණුම් කළමනාකරණ සහකාර විසින් ඉදිරිපත් කරන ලද සීතාවක ප්‍රාදේශීය සභාවේ 2018.03.31 දිනට හිග ආදායම් වාර්තාව සහ වරිපනම් බදු 2018.03.31 දිනට හිග ආදායම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් සියළුදෙනාගේ දැන ගැනීම සඳහා කියවා ඉදිරිපත් කරන ලදී.

18.සීතාවක ප්‍රාදේශීය සභා හංවැල්ල පිලිප් ගුණවර්ධන අනුස්මරණ මහජන පුස්තකාලය සඳහා නොමිලේ ලබා දී ඇති විවෘත කේත මෘදුකාංග පද්ධතියක් වන කොහා මෘදුකාංගය භාවිතයෙන් පුස්තකාලය ස්වයංක්‍රියකරණය කර ඇති අතර, ඒ තුළින් ඉතාමත් කාර්යක්ෂම හා විධිමත් ආකාරයෙන් සේවාවන් ඉටු කිරිමට හැකියාව ලැබී ඇති බැවින් කොස්ගම, පාදුක්ක හා කහහේන යන පුස්තකාල සඳහාද කොහා මෘදුකාංගය මිලදි ගැනිමට අනුමැතිය ලබා දෙන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරි විසින් 2018.04.27 දිනැතිව කරන ලද ඉල්ලීම සලකා බැලු කාරක සභාව, එකවර මෙම මෘදුකාංග කිහිපයක් මිලදී ගැනිමේදී වියදම අවම වන බවද සැලකිල්ලට ගනිමින් කොස්ගම, පාදුක්ක හා කහහේන යන පුස්තකාල සඳහාද එකවර කොහා මෘදුකාංගය මිලදී ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

19.සීතාවක ප්‍රාදේශීය සභා හංවැල්ල පිලිප් ගුණවර්ධන අනුස්මරණ මහජන පුස්තකාලය සඳහා අධ්‍යයන අංශය, විමර්ශන අංශය, බැහැර දෙන අංශය හා යෝජිත ළමිමහන් අධ්‍යයන අංශය සඳහා කැමරා පද්ධතියක් සවිකිරිම හා එම ආරක්ෂිත කැමරා නිරික්ෂණය කිරිමට පුස්තකාලයාධිපතිට පහසුකම් සැලසීමටත්, පොත් බැහැර කිරිමට විධානයක් ලබා නොදුන් පොතක් බැහැර කිරිමේ සංඥා නිකුත් කරන බාර් කෝඩ් 01 ක් ලබා ගැනීම හා පුස්තකාල පාඨකයින්ට ලබා දෙන පුස්තකාල සේවාවන් පිළිබඳ තෘප්තිමත්භාවය පරිගණක ආශ්‍රයෙන් සටහන් කිරිමේ පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය වන කටයුතු ඉටු කරදෙන ලෙස ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරි විසින් 2018.04.27 දිනැතිව කරන ලද ඉල්ලීම් සලකා බැලු කාරක සභාව, ඉහත සඳහන් කාර්යයන් ඉටු කර ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

20. ගරු කාරක සභා සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද පහත යෝජනා පිළිබඳව සලකා බැලු කාරක සභාව, ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

01. පරණ ට්‍රැක්ටර් ටේලරයකට වතුර බවුසරයක් සැදීම.
02. සමර් හට් 08 ක් අළුත්වැඩියා කිරිම සහ අළුතින් සමර් හට් 02 ක් ලබා ගැනීම.
03.උත්සව ශාලාව සඳහා අළුතින් පුටු ලබා ගැනීම.
04. වතුර ටැංකිය තැබීම සඳහා ආධාරකයක් සකස් කිරිම.
05. 500 W / 1000 W ෆැස් ලයිට් 04 ක් ලබා ගැනීම.
06.වෙසක් සතියට උප කාර්යාල 04ට ලයිට් වැල් 100 ක් හා බෞද්ධ කොඩි 100 ක් ලබා ගැනීම.
07. ප්‍රධාන කාර්යාලයට නව අභ්‍යන්තර දුරකථන පද්ධතියක් සවි කිරිම.
08.සීතාවක ප්‍රාදේශීය සභාවට කැමරාවක් මිලදී ගැනීම.
09. ප්‍රධාන කාර්යාලයට ගිනි නිවීමේ ආරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරිම.
10. ප්‍රධාන කාර්යාලයේ සෝලා පවර් පද්ධතියක් ස්ථාපිත කර විදුලිබලය ඉතිරි කර ගැනීමට කටයුතු කිරිම.
11. කහහේන සතිපොළෙහි විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරිම.

21. හංවැල්ල නව, හංවැල්ල පැරණි හා කළුඅග්ගල යන වෙළඳ සංකීර්ණයන්හි 2018.02.28 දිනට පෙර හිග කඩකුලි ගෙවන ලෙස දන්වා තිබියදීත් මෙතෙක් හිග කඩ කුලි ගෙවා නොමැති කඩ සම්බන්ධයෙන් විෂයභාර කළමනාකරණ සහකාර විසින් ඉදිරිපත් කරන ලද ලේඛනය සලකා බැලූ කාරක සභාව, ගිවිසුම් ප්‍රකාරව කඩ කුලි ගෙවීම පැහැර හැර ඇති සියළුම කඩ මුද්‍රා තබා සභාවට පවරා ගැනීම සඳහා කටයුතු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

22. 2018.03.21 දින සිට 2018.03.25 දින දක්වා පාදුක්ක, අංගම්පිටිය, බෝගහ අසල පැවැත්වූ සත්සර මේලා වෙළඳ සැණකෙලිය නීතිමය ප්‍රශ්න මත අසාර්ථක වූ බවත්, සභාවෙන් අනුමැතිය ලබා ගත් ප්‍රවේශ පත්‍ර ඉතිරි වූ බැවින් ඒ සඳහා වූ බදු මුදල් නිදහස් කර දෙන ලෙස ඉල්ලමින් පුගොඩ, කෙලින් වීදිය, නො. 35 හි පදිංචි එච්.පී.අයි. එන් තිලකරත්න මයා විසින් 2018.03.27 දිනැතිව ඉදිරිපත් කරන ලිපිය, ඒ සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නිති නිලධාරි විසින් යොමු කරන ලද LGD/05/05/01/2018 ලිපියේ සඳහන් කර ඇති කොන්දේසි අනුගමනය කර ඇත්නම් මෙම විනෝද බදු නිදහස් කිරිම කළ හැකි බවත් සඳහන් ලිපිය හා ආදායම් පරිපාලක පාදුක්ක විසින් ඉදිරිපත් කරන ලද වාර්තාද සැලකිල්ලට ගෙන ලිපියේ සඳහන් කොන්දේසි ප්‍රකාරව කටයුතු කර නොමැති බැවින් විනෝද බදු මුදල් ආදායමට ගැනීම සඳහා සුදුසු බවට තීරණය කරන ලදී.

23. හංවැල්ල පැරණි උප කාර්යාලය පැවති ගොඩනැගිල්ල ජාතික ඉතිරිකිරිමේ බැංකුවේ හංවැල්ල ශාඛාව පවත්වාගෙන යාමට කුලි පදනම මත 2017.02.05 දින සිට 2019.02.05 දින දක්වා දෙවසරක කාල සීමාවක් සඳහා බදු ලබා දී ඇති බවත් ඉදිරියේදී මාර්ගය පුළුල් කිරිමේදී මෙම ගොඩනැගිල්ල ඉවත් කිරිමට සිදු වන බැවින් තවදුරටත් ගිවිසුම් කාලය දිර්ඝ කළ නොහැකි බවට ජාතික ඉතිරිකිරිමේ බැංකුව වෙත දන්වා යැවීම සුදුසු බවට තීරණය කරන ලදී.

**<u>02. (අ) ආවරණ අනුමැතියට යටත්ව කරන ලද ගෙවීම් සලකා බැලීම.</u>**

2018 අප්‍රේල් 17 වන දින පැවති මහා සභාවේ තීරණ අංක 05 – (05) යටතේ පවරන ලද ගෙවීමේ බලය අනුව ආවරණ අනුමැතියට යටත්ව කරන ලද පහත සඳහන් ගෙවීම් අනුමත කිරිමට කාරක සභාව තීරණය කරන ලදී.

| අනු අංක | වවුචර් අංකය හා දිනය | විස්තරය | ගෙවීම ලබන්නා | මුදල රු. |
|---|---|---|---|---|
| 01 | 800<br>2018.04.26 | 2018.03.26 දින ගලගෙදර ආදාහනාගාරයට ලබා ගත් ගෑස් සිලින්ඩර් 03 ක් සඳහා මුදල් ගෙවීම. | පාදුක්ක ගෑස් සේල්ස් සෙන්ටර්, 01/ඒ, ඉංගිරිය පාර, පාදුක්ක. | 16,461.00 |
| 02 | 801<br>2018.04.26 | 2018.04.03, 2018.04.10 හා 2018.04.19 යන දින වලදී ගලගෙදර ආදාහනාගාරයට ලබා ගත් ගෑස් සිලින්ඩර් සඳහා මුදල් ගෙවීම.<br>(රු.16,461.00 ×3) | පාදුක්ක ගෑස් සේල්ස් සෙන්ටර්, 01/ඒ, ඉංගිරිය පාර, පාදුක්ක. | 49,383.00 |

| | | | | |
|---|---|---|---|---|
| 03 | 791<br>2018.04.19 | ආපදා ණය ගෙවීම. | ඩබ්.සරත් කුමාරසිරි,<br>පාදුක්ක උප කාර්යාලය. | 194,400.00 |
| 04 | 797<br>2018.04.24 | පාදුක්ක උප කාර්යාලයේ නිලධාරින් සහ සේවකයින් සඳහා 2018 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම. | සරප් - කාර්යභාර නිලධාරි<br>පාදුක්ක උප කාර්යාලය | 151,649.40 |
| 05 | 123 බී<br>2018.04.26 | මහජන බැංකු ගිණුමට අයත් චෙක්පතක් වැරදීමකින් ලංකා බැංකු ගිණුමට ඇතුළත් වීම නිවැරදි කිරීම. | සභාපති, සීතාවක<br>ප්‍රාදේශීය සභාව,හංවැල්ල. | 486.50 |
| 06 | 802<br>2018.04.26 | ප්‍රධාන කාර්යාලයේ මුද්දර අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම. | සරප් -  ප්‍රධාන කාර්යාලය | 6407.00 |
| 07 | 790<br>2018.04.19 | පරිපාලන ගොඩනැගිල්ල, හංවැල්ල මහජන පුස්තකාල ගොඩනැගිල්ල හා ඒ ආශ්‍රිත පරිශ්‍රයේ පවිත්‍රතා කටයුතු හා සනීපාරක්ෂක කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් 2018.03.01 දින සිට 2018.03.31 දින දක්වා කාලයට අදාලව මුදල් ගෙවීම. | සමීරා සිකියුරිටි සර්විසස්,<br>හෝකන්දර පාර,<br>පන්නිපිටිය. | 69,500.00 |
| 08 | 788<br>2018.04.19 | හංවැල්ල උප කාර්යාලයේ නිලධාරින් සහ සේවකයින් සඳහා 2018 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම. | සරප් - කාර්යභාර නිලධාරි<br>හංවැල්ල උප කාර්යාලය. | 87,126.99 |
| 09 | 788<br>2018.04.19 | හංවැල්ල උප කාර්යාලයේ නිලධාරින් සහ සේවකයින් සඳහා 2018 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම. | සරප් - කාර්යභාර නිලධාරි<br>හංවැල්ල උප කාර්යාලය. | 107,178.36 |
| 10 | 737<br>2018.04.19 | ප්‍රධාන කාර්යාලයේ නිලධාරින් සහ සේවකයින් සඳහා 2018 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම. | සරප් - ප්‍රධාන කාර්යාලය. | 61,487.72 |
| 11 | 799<br>2018.04.25 | 2018 අප්‍රේල් මස 1 දින සිට 15 දින දක්වා දේශිය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළ යුතු වැට් මුදල් ගෙවීම. | දේශිය<br>ආදායම් කොමසාරිස්, | 140,772.50 |
| 12 | 798<br>2018.04.24 | කහහේන උප කාර්යාලයේ නිලධාරින් සහ සේවකයින් සඳහා 2018 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම. | සරප් - කාර්යභාර නිලධාරි<br>කහහේන උප කාර්යාලය. | 38,137.86 |

## 02. (ආ) ආයතනික ගෙවීම් සලකා බැලීම.

2018 අප්‍රේල් 17 වන දින පැවති මහා සභාවේ තීරණ අංක 05 – (06) යටතේ පවරන ලද අනුමත කිරීමේ බලය අනුව පහත සඳහන් ගෙවීම් අනුමත කිරීමට කාරක සභාව තීරණය කරන ලදී.

| අනු අංක | විස්තරය | ගෙවීම් ලබන්නා | මුදල රු. |
|---|---|---|---|
| 01 | කහහේන සතිපොළෙහි 2018 මාර්තු මස විදුලි බිල්පත ගෙවීම. | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 1,008.60 |
| 02 | කහහේන උප කාර්යාලයට අයත් පහත ස්ථාන සඳහා 2018 මාර්තු මස ජල බිල්පත් ගෙවීම.<br>උප කාර්යාලය 583.05<br>මාතෘ සායනය 1650.25<br>වෙළඳ සංකීර්ණය 716.45 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය. | 2,949.75 |
| 03 | කහහේන උප කාර්යාලයේ 2018 මාර්තු මස සංග්‍රහ වියදම් ගෙවීම. | සරප් - කාර්යභාර නිලධාරි<br>කහහේන උප කාර්යාලය. | 970.00 |
| 04 | කහහේන උප කාර්යාලයට ඉබි යතුරක් ලබා ගැනිම වෙනුවෙන් වැය වූ මුදල් ලබා ගැනීම. | සරප් - කහහේන උප කාර්යාලය<br>වයි.එච්.එස්. ශ්‍රීයාකාන්ති මිය. | 110.00 |
| 05 | නිවාඩු දින වලදී කහහේන මහජන පුස්තකාලයේ යතුරු රාජකාරි සඳහා කහහේන සිට ප්‍රධාන කාර්යාලයට යාම හා ඒම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | සරප් - කහහේන උප කාර්යාලය<br>කේ.පී සන්ධ්‍යා ලක්මාලි මිය. | 390.00 |
| 06 | නිවාඩු දින වලදී කහහේන මහජන පුස්තකාලයේ යතුරු රාජකාරි සඳහා කහහේන සිට ප්‍රධාන කාර්යාලයට යාම හා ඒම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | සරප් - කහහේන උප කාර්යාලය<br>ඒ.එම්. රේණුකා මිය. | 136.00 |
| 07 | කහහේන උප කාර්යාලයට අයත් පහත ස්ථාන සඳහා 2018 අප්‍රේල් මස විදුලි බිල්පත් ගෙවීම.<br>උප කාර්යාලය 1704.06<br>මාතෘ සායනය 569.40<br>මහජන පුස්තකාලය 12441.90 | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 14,715.00 |
| 08 | කහහේන මහජන පුස්තකාලයට පුවත්පත් හා සඟරා ලබා ගැනීම වෙනුවෙන් 2018 මාර්තු මස පුවත්පත් බිල ගෙවීම. | එච්.එම්.ඩී. හේරත් මයා,<br>කහහේන, වග. | 9,345.00 |

| | | | |
|---|---|---|---|
| 09 | දඹෝර මහජන පුස්තකාලයට පුවත්පත් හා සගරා ලබා ගැනීම වෙනුවෙන් 2018 මාර්තු මස පුවත්පත් බිල ගෙවීම. | ඩී.එස්. මාපටුන මයා,<br>නො.03, හංවැල්ල පාර, පාදුක්ක. | 4,390.00 |
| 10 | පාදුක්ක උප කාර්යාලයට අයත් පහත ස්ථානයන් සඳහා 2018 මාර්තු මස විදුලි බිල්පත් ගෙවීම.<br><br>දිවාසුරැකුම් මධ්‍යස්ථානය - මීපේ - 1063.50<br>ප්‍රජා ශාලාව - මීපේ 404.70<br>පොදු වැසිකිලිය බස්නැවතුම්පල - පාදුක්ක 240.00<br>කාර්යාලය 2307.90<br>ආයුර්වේදය - පාදුක්ක 441.30<br>ප්‍රජා ශාලාව - පාදුක්ක 240.00<br>ආයුර්වේදය - පිටුම්පේ 843.90<br>ගලගෙදර ආදාහනාගාරය 3405.90<br>පුස්තකාලය - පාදුක්ක 4028.10<br>පෙර පාසල - පාදුක්ක 423.00<br>ආයුර්වේදය මලගල (මාර්තු) 423.00<br>ආයුර්වේදය මලගල (පෙබරවාරි) 477.90<br>පුස්තකාලය - දඹෝර 423.00 | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 14,722.20 |
| 11 | පාදුක්ක උප කාර්යාලයට අයත් පහත ස්ථානයන් සඳහා 2018 මාර්තු මස ජල බිල්පත් ගෙවීම.<br><br>පොදු වෙළඳපල - නව 6267.50<br>ගලගෙදර ආදාහනාගාරය 2964.57<br>පාදුක්ක පුස්තකාලය 2633.50<br>පොදු වැසිකිලිය - පාදුක්ක 2300.00<br>පෙර පාසල - පාදුක්ක 85.10<br>බස් නැවතුම්පල - පැරණි 1516.85 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය. | 15,767.52 |
| 12 | පාදුක්ක උප කාර්යාලයේ 2018 මාර්තු මස සැලසුම් කමිටුව සඳහා සහභාගි වූ පහත නිලධාරීන් වෙත සැලසුම් කමිටු දීමනා ගෙවීම.<br><br>චන්දන පද්මසිරි මයා - ලේකම් 2600.00<br>නදීකා පල්ලියගුරු මෙය - සැලසුම් නිලධාරි 2600.00<br>ජයන්තා ජල්තොටගේ මිය - වැඩ අධිකාරි 2600.00<br>පී.වී.ඩී.එන්. පාදුක්ක මිය - කළ/සහකාර 2600.00 | සරප් - කාර්යභාර නිලධාරි<br>පාදුක්ක උප කාර්යාලය. | 10,400.00 |
| 13 | පාදුක්ක මහජන පුස්තකාලයට පුවත්පත් හා සගරා ලබා ගැනීම වෙනුවෙන් 2018 මාර්තු මස බිල්පත ගෙවීම. | ඩී.එස්. මාපටුන මයා,<br>නො. 03, හංවැල්ල පාර, පාදුක්ක. | 10,505.00 |
| 14 | පාදුක්ක උප කාර්යාලයේ සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම. | සරප් - කාර්යභාර නිලධාරි<br>පාදුක්ක උප කාර්යාලය. | 925.00 |

| | | | |
|---|---|---|---|
| 15 | පාදුක්ක උප කාර්යාලයේ භාවිතා කරන ලී ඇදි පුටු 03 ක වැල් කැඩී ඇති බැවින් අළුත්වැඩියාව සඳහා වැල් ලබා ගැනීම වෙනුවෙන් වැය වූ මුදල් ලබා ගැනීම. | සරප් - එස්.ඩී. ගමගේ මිය.<br>පාදුක්ක උප කාර්යාලය. | 255.00 |
| 16 | පාදුක්ක උප කාර්යාලයට අයත් පහත වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා 2018.03.21 දින සිට 2018.04.07 දින දක්වා ලබා ගත් ඉන්ධන වෙනුවෙන් මුදල් ගෙවීම.<br><br>ABP – 9738 ත්‍රිවිලරය 3726.00<br>RD – 8070 ට්‍රැක්ටරය 7375.00<br>RD – 9425 ට්‍රැක්ටරය 6000.00<br>තණකොළ කපන යන්ත්‍රය 4864.91<br>ZA – 9257 කම්පැක්ටරය 18600.00<br>මාර්ගතලනය 1000.00 | සී/ස නැගෙනහිර හේවාගම් කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිතිය,<br>පහත්ගම, හංවැල්ල. | 41,565.91 |
| 17 | පාදුක්ක උප කාර්යාලයට අයත් මලගල ආයුර්වේදයේ 2018 අප්‍රේල් මස විදුලි බිල්පත ගෙවීම. | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 441.30 |
| 18 | කොස්ගම උප කාර්යාලයට අයත් පහත ස්ථානයන්හි 2018 මාර්තු මස විදුලි බිල්පත් ගෙවීම.<br><br>කොස්ගම සතිපොළ<br>(ගි.අ.4693228311) 9402.85<br>කොස්ගම සතිපොළ මාළු කඩය<br>(ගි.අ. 4616014000) 240.00<br>කොස්ගම සතිපොළ<br>(ගි.අ.4616126909) 240.00<br>කොස්ගම සතිපොළ මාළු කඩය<br>(ගි.අ. 4616001502) 1667.40 | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 11,550.25 |
| 19 | කොස්ගම උප කාර්යාලයට අයත් පහත ස්ථානයන්හි 2018 මාර්තු මස විදුලි බිල්පත් ගෙවීම.<br><br>අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය 1685.70<br>ප්‍රජා ශාලාව - සාලාව 313.20<br>ප්‍රජා ශාලාව - මාවල්ගම 477.90<br>ප්‍රජා ශාලාව - අනෝමා 477.90<br>කොස්ගම උප කාර්යාලය 8217.65 | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 11,169.35 |
| 20 | කොස්ගම උප කාර්යාලයට අයත් පහත ස්ථානයන්හි 2018 මාර්තු මස ජල බිල්පත් ගෙවීම. ප්‍රජා ශාලාව - සාලාව 929.23<br><br>පෙර පාසල - කනම්පැල්ල 637.59 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය. | 1,566.82 |

| | | | |
|---|---|---|---|
| 21 | කොස්ගම උප කාර්යාලයේ 2018 මාර්තු මස සැලසුම් කමිටුව සඳහා සහභාගි වූ පහත නිලධාරින් වෙත සැලසුම් කමිටු දීමනා ගෙවීම.<br><br>චන්දන පද්මසිරි මයා - ලේකම් 3250.00<br>ඉන්දු විතාරණ මිය- සැලසුම් නිලධාරි 3250.00<br>ජයන්තා ජල්තොටගේ මිය - වැඩ අධිකාරි 3250.00<br>පී.වී.ඩී.එන්. පාදුක්ක මිය - කළ/සහකාර 3250.00 | සරප් - කාර්යභාර නිලධාරි<br>කොස්ගම උප කාර්යාලය. | 13,000.00 |
| 22 | කොස්ගම මහජන පුස්තකාලයට පුවත්පත් හා සගරා ලබා ගැනීම වෙනුවෙන් 2017 නොවැම්බර් මස බිල්පත ගෙවීම. | ඩී.ජී.එම්. කාරියවසම් මයා,<br>පුවත්පත් නියෝජිත, කොස්ගම. | 6,925.00 |
| 23 | කොස්ගම මහජන පුස්තකාලයට පුවත්පත් හා සගරා ලබා ගැනීම වෙනුවෙන් 2017 දෙසැම්බර් මස බිල්පත ගෙවීම. | ඩී.ජී.එම්. කාරියවසම් මයා,<br>පුවත්පත් නියෝජිත, කොස්ගම. | 7,290.00 |
| 24 | කොස්ගම මහජන පුස්තකාලයට පුවත්පත් හා සගරා ලබා ගැනීම වෙනුවෙන් පහත මාසයන් සඳහා බිල්පත් ගෙවීම.<br><br>2018 ජනවාරි 7135.00<br>පෙබරවාරි 6430.00<br>මාර්තු 7230.00 | ඩී.ජී.එම්. කාරියවසම් මයා, පුවත්පත් නියෝජිත, කොස්ගම. | 20,795.00 |
| 25 | කොස්ගම උප කාර්යාලයේ මුද්දර අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම. | සරප් - කොස්ගම උප කාර්යාලය | 3,480.00 |
| 26 | කොස්ගම උප කාර්යාලයේ 2018 වර්ෂයේ වෙළඳ බලපත්‍ර සහ ව්‍යාපාර බදු අවසන් නිවේදන යැවීම සඳහා මුද්දර ලබා ගැනීම. | සරප් - කොස්ගම උප කාර්යාලය. | 8,000.00 |
| 27 | ගලි බවුසරයේ අප ජලය මනුවලවල් වලට මුදා හැරීම වෙනුවෙන් 2018 පෙබරවාරි මාසය වෙනුවෙන් ගෙවීම් කිරීම. | කළමනාකරු,<br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,<br>නො. 480/බී, රොක්සින් ගාඩින්ස්,<br>වැල්ලවත්ත. | 4,657.50 |
| 28 | ගලි බවුසරයේ අප ජලය මනුවලවල් වලට මුදා හැරීම වෙනුවෙන් 2018 මාර්තු මාසය වෙනුවෙන් ගෙවීම් කිරීම. | කළමනාකරු,<br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,<br>නො. 480/බී, රොක්සින් ගාඩින්ස්,<br>වැල්ලවත්ත. | 8,280.00 |

| | | | |
|---|---|---|---|
| 29 | LE – 6946 දරණ ටිපර් රථයේ පිටුපස රෝදයක වූ පැච් 01 ක් සාදා ගැනීම වෙනුවෙන් පාදුක්ක,ගලගෙදර, හයිලෙවල් පාර, 190/1, කොඩිතුවක්කු ටයර් හවුස් සහ බැටරි සෙන්ටර් වෙත ගෙවූ මුදල ගෙවීම. | සරජ - කොස්ගම උප කාර්යාලය. ඩබ්.ඩී.සී.චමින්ද මයා | 250.00 |
| 30 | QL – 6131 දරණ ත්‍රීරෝද රථය 2018.04.01 වන දින සේවා කිරීම හා නව බ්‍රේක් වොෂර් යෙදීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | හේමාල් මෝටර්ස්, 142/2, පහත්ගම, හංවැල්ල. | 5010.00 |
| 31 | HE – 5534 දරණ ගලි බවුසර් රථයේ කැඩී ගිය ගියර් කේබලය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | නිව් ෆාසිල් ඔටෝ කේබල්ස්, 84/10, අවිස්සාවේල්ල පාර, ඉහළ හංවැල්ල, හංවැල්ල. | 1750.00 |
| 32 | ZA – 5041 දරණ බැකෝ යන්ත්‍රයට අදාළව 2018.06.01 වන දින සිට 2019.05.31 වන දින දක්වා නව ආදායම් බලපත්‍රය, දුම් සහතිකය හා යෝග්‍යතා සහතිකය ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ගෙවීම. | සරජ - ප්‍රධන කාර්යාලය<br>ආර්.ඩී.රංජිත් ප්‍රේමසිරි මයා | 8110.00 |
| 33 | LL – 6461 දරණ ටිපර් රථයට අදාළව 2018.05.31 වන දින සිට 2019.05.30 වන දින දක්වා නව රක්ෂණාවරණය සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, අවිස්සාවේල්ල | 102145.57 |
| 34 | HE – 5534 දරණ ගලි බවුසර් රථයට අදාළව 2018.05.29 වන දින සිට 2019.05.28 වන දින දක්වා නව රක්ෂණාවරණය සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, අවිස්සාවේල්ල | 21336.47 |
| 35 | LE - 6946 දරණ ටිපර් රථයේ අළුත්වැඩියාවන් කිහිපයක් සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | සෙන්ට්‍රල් මෝටර්ස්, 58/5, හංවැල්ල පාර, පාදුක්ක | 40250.00 |
| 36 | 2018.02.01 වන දින සිට 2018.03.30 වන දින දක්වා සභාවේ වාහන සඳහා ණයට ලබා ගත් ඉන්ධනවලට අදාළ බිල්පත් සඳහා ගෙවීම් කිරීම.<br>252 - 6388 කැබ් රථය 47750.00<br>251- 0684 කෘෘ කැබ් රථය 26800.00<br>LE - 6946 ටිපර් රථය 41230.14<br>LL - 6461 ටිපර් රථය 47500.00<br>HE - 5534 ගලි බවුසර් රථය 38500.00<br>GI - 3144 ත්‍රීරෝද රථය 15392.64<br>QL - 6131 ත්‍රීරෝද රථය 9234.00<br>AAA - 8572 ත්‍රීරෝද රථය 8532.00 | සී/ස නැගෙනහිර හේවාගම් කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිතිය, හංවැල්ල | 380508.78 |

| | | | |
|---|---|---|---|
| | AAA - 9451 ත්‍රීරෝද රථය 9180.00<br>RD - 8301 ට්‍රැක්ටරය 38400.00<br>LM - 5604 කම්පැක්ටරය 28500.00<br>ZA - 5041 බැකෝ යන්ත්‍රය 53600.00<br>ස්කිඩ් ස්ටියර් ලෝඩර් 13300.00<br>කොස්ගම තණකොළ කපන යන්ත්‍රය 1610.00<br>හංවැල්ල තණකොළ කපන යන්ත්‍රය 980.00 | | |
| 37 | දිස්ත්‍රික් පළාත් පාලන ක්‍රීඩා උළෙල වෙනුවෙන් ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීම. | සභාපති,<br>සීතාවක ප්‍රාදේශීය සභාව | 100,000.00 |
| 38 | 2018 මැයි මස පැවැත්වීමට නියමිත පළාත් පාලන පළාත් ක්‍රීඩා උළෙල සඳහා සභාවේ දිස්ත්‍රික් තරග වලින් ජයගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගි කරවීම වෙනුවෙන් අත්තිකාරම් මුදල් ලබා ගැනීම.<br><br>ප්‍රවාහන වියදම් 20000.00<br>ප්‍රථමාධාර 10000.00<br>ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ආහාර ලබා දීම 25000.00<br>( දින 02 ක් සඳහා)<br>අවිනිශ්චිත වියදම් 10000.00 | සරප් - ආර්.පී.එන්.පී. ජිනදාස මයා - ප්‍රධාන කාර්යාලය. | 65,000.00 |
| 39 | ගලි බවුසරයේ අපද්‍රව්‍ය ගල්කිස්ස ජල පොම්පාගාරයට ගෙනයාමේදී ගලි බවුසරයේ රියදුරු ලෙස ගමන් කිරිම වෙනුවෙන් 2018 පෙබරවාරි හා මාර්තු මාසය වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | සරප් - හංවැල්ල උප කාර්යාලය.<br>W.P.සෝමරත්නම් මයා<br>රියදුරු -සෞඛ්‍ය අංශය | 4667.25 |
| 40 | ගලි බවුසරයේ අපද්‍රව්‍ය ගල්කිස්ස ජල පොම්පාගාරයට ගෙනයාමේදී ගලි බවුසරයේ රිය සහායක ලෙස ගමන් කිරිම වෙනුවෙන් 2018 පෙබරවාරි මාසය වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | සරප් - හංවැල්ල උප කාර්යාලය.<br>N.දේවේන්ද්‍රන් මයා | 848.75 |
| 41 | ගලි බවුසරයේ අපද්‍රව්‍ය ගල්කිස්ස ජල පොම්පාගාරයට ගෙනයාමේදී ගලි බවුසරයේ රිය සහායක ලෙස ගමන් කිරිම වෙනුවෙන් 2018 පෙබරවාරි මාසය වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | සරප් - හංවැල්ල උප කාර්යාලය.<br>H.S.R.මුතුකුමාර් මයා | 169.75 |

| | | | |
|---|---|---|---|
| 42 | ගලි බවුසරයේ අපද්‍රව්‍ය ගල්කිස්ස ජල පොම්පාගාරයට ගෙනයාමේදී ගලි බවුසරයේ රිය සහායක ලෙස ගමන් කිරිම වෙනුවෙන් 2018 පෙබරවාරි හා මාර්තු මාසය වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | සරප් - හංවැල්ල උප කාර්යාලය. P.පුෂ්පකුමාර මයා. | 1734.25 |
| 43 | ගලි බවුසරයේ අපද්‍රව්‍ය ගල්කිස්ස ජල පොම්පාගාරයට ගෙනයාමේදී ගලි බවුසරයේ රිය සහායක ලෙස ගමන් කිරිම වෙනුවෙන් 2018 පෙබරවාරි හා මාර්තු මාසය වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | සරප් - හංවැල්ල උප කාර්යාලය. M.K.සිවකුමාර් මයා. | 1904.00 |
| 44 | ගලි බවුසරයේ අපද්‍රව්‍ය ගල්කිස්ස ජල පොම්පාගාරයට ගෙනයාමේදී ගලි බවුසරයේ රිය සහායක ලෙස ගමන් කිරිම වෙනුවෙන් 2018 මාර්තු මාසය වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | සරප් - හංවැල්ල උප කාර්යාලය. L.A.P.S.මධූෂංක මයා. | 175.00 |
| 45 | 2018 මාර්තු මස හංවැල්ල ආයුර්වේදය සඳහා ඖෂධ ගෙන ඒමට නාවින්න ඖෂධ සංස්ථාවට යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | සරප් - හංවැල්ල උප කාර්යාලය. T.A.S.C.ජයතිලක මිය. | 250.00 |
| 46 | 2018 මාර්තු මස හංවැල්ල ආයුර්වේදය සඳහා ඖෂධ ගෙන ඒමට නාවින්න ඖෂධ සංස්ථාවට යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | සරප් - හංවැල්ල උප කාර්යාලය. J.N.T.මල්කාන්ති මිය. | 175.00 |
| 47 | හංවැල්ල මහජන පුස්තකාලයට ලබා ගත් පුවත්පත් හා සගරා වෙනුවෙන් 2018 මාර්තු මස පුවත්පත් බිල ගෙවීම. | A.R.A.ෆාරිස් මයා, මහජන වෙළඳ සල, හංවැල්ල. | 10365.00 |
| 48 | හංවැල්ල පිලිප් ගුණවර්ධන අනුස්මරණ මහජන පුස්තකාලයේ 2018 මාර්තු මස සංග්‍රහ වියදම් ගෙවීම. | සරප් - හංවැල්ල උප කාර්යාලය. S.M.රංජනී මිය. | 255.00 |
| 49 | 2018 මාර්තු මස හංවැල්ල උප කාර්යාලයේ සැලසුම් කමිටුව සඳහා සහභාගි වූ නිලධාරින්ට සැලසුම් කමිටු දීමනා ගෙවීම.<br>චන්දන පද්මසිරි මයා - ලේකම් 3250.00<br>ඉන්දු විතාරණ මිය - සැලසුම් නි. 3250.00<br>ජයන්තා ජල්තොටගේ මිය - වැඩ අධිකාරි 3250.00<br>පී.වී.ඩී.එන්. පාදුක්ක මිය - කළ/සහකාර 3250.00 | සරප් - හංවැල්ල උප කාර්යාලය<br>කාර්ය භාර නිලධාරී | 13000.00 |

| | | | |
|---|---|---|---|
| 50 | ගලගෙදර ආදාහනාගාරයේ අළුත්වැඩියා හා සේවා කටයුතු ඉටු කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | එම්.එන්.ජී.කන්ස්ට්‍රක්ෂන්ස් පුද්ගලික සමාගම, 920/02, සියඹලාපෙවත්ත,දෙල්ගොඩ. | 134,308.50 |
| 51 | හංවැල්ල නොදිරන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ සාදන පොලිතින්, ප්ලාස්ටික්,බේල් පුත්තලම INSEE ආයතනය වෙත ප්‍රවාහනය කිරීම සඳහා කන්ටේනර් රථයක සේවාව ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම (2018.04.11 හා 12 දිනවල) | අබේසිංහ ෆ්ලීට් මැනේජ්මන්ට් සර්විසස් පුද්ගලික සමාගම,කොළඹ පාර,පහත්ගම,හංවැල්ල. | 42,550.00 |
| 52 | කොස්ගම හා පාදුක්ක උප කාර්යාලවලට අයත් ට්‍රැක්ටර් කොස්ගම කොම්පොස්ට් අංගනයට යාමට පෙර කසල සමග බර කිරීම සඳහා පාලම් තරාදියක සේවාව ලබා ගැනීම වෙනුවෙන් 2018 මාර්තු මාසයට අදාලව මුදල් ගෙවීම. | ඒ.එච්.එල්.ඩී.ආරියරත්න මහතා, නිව් අතපත්තු වේ බ්‍රිජ්, ප්‍රධාන පාර, බොරළුගොඩ, කොස්ගම. | 13,200.00 |
| 53 | අංක 23623P දරණ නඩුව වෙනුවෙන් 2017.10.27 , 2018.02.16 හා 2018.03.23 යන දිනයන්හීදී අවිස්සාවේල්ල දිසා අධිකරණයේ පෙනී සිටීම වෙනුවෙන් නීතිඥ ගාස්තු ගෙවීම. | නීතිඥ චම්පා.සී.චන්ද්‍රදාස මිය, සීතාවක, අවිස්සාවේල්ල. | 6,000.00 |
| 54 | ඇණවුම් අංක 12248 හා භාණ්ඩ ලැබීම් පත්‍රිකා අංක 2250 පරිදි සපයා ගන්නා ලද 23W CFL බල්බ 1000ක් හා 1/044 වයර් රෝල් 15 ක් වෙනුවෙන් මුදල් ගෙවීම. | ඔරෙල් කෝපරේෂන් පුද්ගලික සමාගම,ට්‍රිපෝලි ස්කෙවයාර්, කොළඹ . | 501,976.55 |
| 55 | ඇණවුම් අංක 12213 හා භාන්ඩ ලැබීම් පත්‍රිකා අංක 2256 පරිදි ලබා ගන්නා ලද පෙර පාසල් ලදුපත් පොත් 250 ක් හා දේපල තහනම් කිරීමේ ලදුපත් පොත් 250ක් වෙනුවෙන් මුදල් ගෙවීම. | සභාපති, ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය(බ.ප),වෙස්ප්‍රෝ මුද්‍රණාලය,මාලිගාවත්ත පෙදෙස, කොළඹ10. | 132,067.50 |
| 56 | ඇණවුම් අංක 12305 හා භාණ්ඩ ලැබීම් පත්‍රිකා 2251 පරිදි ප්‍රධාන කාර්යාලයට අයත් 12.5 Kg ගෑස් සිලින්ඩරය පිරවීම. | සීමාසහිත නැගෙනහිර හේවාගම් කෝරළගේ වි.සේ.ස සමිතිය, පහත්ගම, හංවැල්ල. | 1,431.00 |

| | | | |
|---|---|---|---|
| 57 | ඇණවුම් අංක 12249 හා භාණ්ඩ ලැබීම් පත්‍රිකා අංක 2252 පරිදි සපයා ගන්නා ලද 2 Pin හෝල්ඩර්ස් 300ක් වෙනුවෙන් මුදල් ගෙවීම. | චාන්දලී ඉලෙක්ට්‍රිකල් ට්‍රේඩර්ස්, 879/20, විහාර හන්දිය,වරාගොඩ,කැලණිය. | 16,200.00 |
| 58 | ඇණවුම් අංක 12306 හා භාණ්ඩ ලැබීම් පත්‍රිකා අංක 2253 පරිදි ලබා ගන්නා ලද UPS යන්ත්‍රය වෙනුවෙන් මුදල් ගෙවීම. | AMW කම්පියුටර්ස් පුද්ගලික සමාගම ,සණස අයිඩියල් සංකීර්ණය,ගම්පහ. | 4,350.00 |
| 59 | ඇණවුම් අංක 12244 හා භාණ්ඩ ලැබීම් පත්‍රිකා අංක 2254 පරිදි ලබා ගන්නා ලද කොම්පොස්ට් අංගනයට අවශ්‍ය ඩිජිටල් මුද්‍රිත ස්ටිකර් වර්ග අඩි 30 ක් වෙනුවෙන් මුදල් ගෙවීම. | නලින් ඇඩ්වටයිසින්, හංවැල්ල පාර, පාදුක්ක. | 2,100.00 |
| 60 | ඇණවුම් අංක 12307 හා භාණ්ඩ ලැබීම් පත්‍රිකා අංක 2255 පරිදි ලබා ගන්නා ලද හංවැල්ල ළදරු පාසැල් ගොඩනැගිල්ල තීන්ත ආලේප කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය තීනර් ලීටර් 04 ක් වෙනුවෙන් මුදල් ගෙවීම. | තිසර ට්‍රේඩින් එන්ටප්‍රයිසස් පුද්ගලික සමාගම, පහත්ගම , හංවැල්ල. | 880.00 |
| 61 | ඇණවුම් අංක 12304 හා භාණ්ඩ ලැබීම් පත්‍රිකා අංක 2257 පරිදි කොස්ගම කොම්පොස්ට් අංගනය සඳහා ලබා ගත් විල් බැරෝ 5 ක් වෙනුවෙන් මුදල් ගෙවීම. | එම්.එස්.එම්. හාඩ්වෙයාර්, ප්‍රධාන පාර,හංවැල්ල. | 12,250.00 |
| 62 | ඇණවුම් අංක 12341 හා භාණ්ඩ ලැබීම් පත්‍රිකා අංක 2260 පරිදි ලබා ගත් 64" x 32" ප්‍රමාණයේ ජාතික කොඩි 50 ක් වෙනුවෙන් මුදල් ගෙවීම. | විජය .DDප් පුද්ගලික සමාගම, හයිලෙවල් පාර, මහරගම. | 9,250.00 |
| 63 | ඇණවුම් අංක 12332 හා භාණ්ඩ ලැබීම් පත්‍රිකා අංක 2259 පරිදි පානීය ජලය 1000ml බෝතල් 216ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | ස්පීඩ් වෝටර් සිස්ටම්ස් පුද්ගලික සමාගම,නො.52,රොබට් ගුණවර්ධන මාවත,කොළඹ 08. | 5832.00 |

| | | | |
|---|---|---|---|
| 64 | ඇණවුම් අංක 12309 හා භාණ්ඩ ලැබීම් පත්‍රිකා අංක 2261 පරිදි හංවැල්ල පුස්තකාලයට ලබාගත් මුද්‍රණ යන්ත්‍රය වෙනුවෙන් මුදල් ගෙවීම. | අසංක පීසී සොලියුෂන්ස්, නො.52,වෙළඳ සංකීර්ණය, හංවැල්ල. | 12,800.00 |
| 65 | ඇණවුම් අංක 12340 හා භාණ්ඩ ලැබීම් පත්‍රිකා අංක 2258 පරිදි ලබාගත් පත් වූ සභිකවරු සඳහා වන නාමපුවරු 45 වෙනුවෙන් මුදල් ගෙවීම. | සැන්ඩි ඇඩ්වටයිසින් සර්විසස් 29/F,ඉංගිරිය පාර.පාදුක්ක. | 33,750.00 |
| 66 | පාදුක්ක උප කාර්යාලයේ 2018 මාර්තු මස සංග්‍රහ වියදම් ගෙවිම. | සරජ - පාදුක්ක උප කාර්යාලය එස්.ඩී ගමගේ මිය. | 1,460.00 |
| 67 | සීතාවක ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර ගාස්තු නිදහස් පැකේජයේ 2018 මාර්තු මස දුරකතන බිල්පත ගෙවීම. | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | 55,497.82 |
| 68 | සීතාවක ප්‍රාදේශීය සභාවේ පුර නැගුම ව්‍යාපෘතිය යටතේ අංක 16481689 දරණ විද්‍යුත් කෙටි පණිවුඩ සේවාව සඳහා 2018 මාර්තු මස බිල්පත ගෙවීම. | මොබිටෙල් පුද්ගලික සමාගම | 226.14 |
| 69 | සීතාවක ප්‍රාදේශීය සභාවේ සංවර්ධන සහකාර වෙත ලබා දී ඇති අංක 036 – 5677686 දරණ ස්ථාවර දුරකතනයේ 2018 මාර්තු මස බිල්පත ගෙවීම. | සී/ස ලංකා බෙල් සමාගම | 952.37 |
| 70 | සීතාවක ප්‍රාදේශීය සභාවේ ගිණුම් අංක 004 013 8377 දරණ වෙබ් අඩවිය සක්‍රීය කර ගැනීමෙ 2018 මාර්තු මස බිල්පත ගෙවීම | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | 6,923.41 |
| 71 | සීතාවක ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ගිණුම් අංක 4610217104 දරණ විදුලි සබඳතාවයේ 2018 අප්‍රේල් මස බිල්පත ගෙවීම. | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම | 24,004.00 |
| 72 | සීතාවක ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ අංක 036 – 3865354 දරණ ස්ථාවර දුරකතනයේ 2018 මාර්තු මස බිල්පත ගෙවීම. | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | 648.73 |

| | | | |
|---|---|---|---|
| 73 | සීතාවක ප්‍රාදේශීය සභාවේ පාදුක්ක පුස්තකාලය වෙත ලබා දී ඇති 036 - 3865349 දරණ ස්ථාවර දුරකතනයේ මාර්තු මස බිල්පත ගෙවීම. | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | 440.88 |
| 74 | සීතාවක ප්‍රාදේශීය සභාවේ සැපයුම් රාජකාරී කටයුතු වෙනුවෙන් දීපානි වික්‍රමසිංහ මිය වෙත ලබා දී ඇති අංක 036 – 3865351 දරණ ස්ථාවර දුරකතනයේ මාර්තු මස බිල්පත ගෙවීම. | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | 871.38 |
| 75 | සීතාවක ප්‍රාදේශීය සභාවේ හංවැල්ල මහජන පුස්තකාලයේ භාවිතා කරන ටොෂිබා ඡායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම 2018.03.30 දිනෙන් අවසන් වූ බැවින් එම ගිවිසුම් කාලය 2018.04.01 දින සිට 2019.03.31 දින දක්වා දීර්ඝ කිරීම. වෙනුවෙන් මුදල් ගෙවීම. | ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් පුද්ගලික සමාගම | 14,504.50 |
| 76 | සීතාවක ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයේ භාවිතා කරන පරිගනකය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල ගෙවීම. | අසංක පී.සී සොලියුෂන්ස්, නව වෙළඳ සංකීර්ණය, හංවැල්ල. | 2700.00 |
| 77 | ප්‍රධාන කාර්යාලයේ කෑම කාමරයෙහි ජල කරාමය අළුත්වැඩියාව සඳහා අවශ්‍ය උපාංග ලබා ගැනීම. | සරප් - ප්‍රධාන කළමනාකරණ සහකාර | 440.00 |
| 78 | ප්‍රධාන කාර්යාලයෙහි සංග්‍රහ වියදම් ප්‍රතිපූර්ණය කිරීම(2018.03.18- 2018.04.20 දක්වා) | සරප් - ප්‍රධාන කළමනාකරණ සහකාර, | 4,815.00 |
| 79 | 2018.04.17 ආරම්භක මහා සභාව සඳහා උදේ ආහාර සැපයීම. | පද්මා නො.132/2/1,දිද්දෙණිය දකුණ, පාදුක්ක. | 24,720.00 |
| 80 | 2018.04.17 ආරම්භක මහා සභාව සඳහා දහවල් ආහාර සැපයීම.(ස්වයං සේවා) | පද්මානො.132/2/1, දිද්දෙණිය දකුණ, පාදුක්ක. | 51,600.00 |

| | | | |
|---|---|---|---|
| 81 | ගොඩනැගිලි ගාස්තු උපලේඛන 2018/2019 පොත් 04ක් බැඳීම වෙනුවෙන් (එක් ලේඛනයක් = 150 x 4 ) | ද ප්‍රින්ට් ෂොප් , කෙලින් වීදිය, හංවැල්ල | 600.00 |
| 82 | ප්‍රධාන කාර්යාලය සඳහා පහත සඳහන් නිල මුද්‍රා සකස් කිරීම.<br>ගරු සභාපතිතුමාගේ නම සහිත නිල මුද්‍රා - 01<br>ගරු සභාපතිතුමාගේ නම රහිත නිල මුද්‍රා - 01<br>ප්‍රජා සංවර්ධන නිලධාරී කේ.ශර්මිලා දූෂානි - නිල මුද්‍රා 01<br>සංවර්ධන නිලධාරී - ඊ.ඒ.ඩී.කේ.එදිරිසිංහ නිල මුද්‍රා 01<br>(රු.450 x 4) | සීතාවක ප්‍රින්ටර්ස් කෙලින් වීදිය, හංවැල්ල. | 1800.00 |
| 83 | 2018 මාර්තු 07, 08, 09, 12, 16, 23, 30 වෙස්ප්‍රෝමුද්‍රණාලය තක්සේරු ආයතනය, පළාත් පාලන කොමසාරිස් කාර්යාලය, ප්‍රධාන අමාත්‍ය කාර්යාලය, ප්‍රධාන අමාත්‍ය කාර්යාලය, නාවින්න ආයුර්වේද දෙහිවල නගර සභාව හා ක්‍රීඩා පිටිය වෙත යාම වෙනුවෙන් සංයුක්ත දීමනාව | සරජ - ප්‍රධාන කාර්යාලය ආර්.ඒ.බී. පද්මපෙරුම මයා | 1225.00 |
| 84 | දත්ත ආකර්ශනය හා ඉලෙක්ට්‍රොනික නීති පිළිබඳ වැඩමුළුවට පළාත් පාලන් ශ්‍රීලංකා ආයතනයට යාම වෙනුවෙන් ගමන් වියදම හා සංයුක්ත දීමනාව. | සරජ - ප්‍රධාන කාර්යාලය ඩී.ජී.ආර්.එච්. කුමාරි මිය | 480.00 |
| 85 | විගණන විමසුම් කාරක සභාව සඳහා පළාත් පාලන අමාත්‍යාංශයට යාම වෙනුවෙන් සංයුක්ත දීමනාව | සරජ - ප්‍රධාන කාර්යාලය ඩබ්.ඩී.ඩී.පී. ජයසේකර මිය | 200.00 |
| 86 | විගණන විමසුම් කාරක සභාවට හා විගණන විමසුම් පුහුණුව සඳහා ශ්‍රාවස්ථි මන්දිරයට හා සෞන්දර්යය නිකේතනයට යාම වෙනුවෙන් සංයුක්ත දීමනාව. | සරජ - ප්‍රධාන කාර්යාලය ඩබ්.ඒ.ඊ. රංජනී මිය | 400.00 |
| 87 | විගණන විමසුම් කාරක සභාව සඳහා ශ්‍රාවස්ථි මන්දිරයට යාම වෙනුවෙන් සංයුක්ත දීමනාව. | සරජ - ප්‍රධාන කාර්යාලය එස්.ඩී. සිරෝෂණී මිය | 200.00 |
| 88 | විගණන විමසුම් කාරක සභාව සඳහා ශ්‍රාවස්ථි මන්දිරයට යාම වෙනුවෙන් සංයුක්ත දීමනාව. | සරජ - ප්‍රධාන කාර්යාලය දීපානි වික්‍රමසිංහ මිය | 200.00 |

| | | | |
|---|---|---|---|
| 89 | 2018 මාර්තු මස මහරගම ජා.ජ.හා.ජ.ම. අවිස්සාවේල්ල ලං.වි.ම හා මොබිටෙල් ආයතනය දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව වෙත යාම හා ඒම වෙනුවෙන් ගමන් වියදම හා සංයුක්ත දීමනාව | සරප් - ප්‍රධාන කාර්යාලය<br>කේ.පී.ආර්. කරවිට මයා | 3799.00 |
| 90 | 2018 මාර්තු මස 04, 11, 17, 18 හා 25 දිනයන්හි ඉටු කරන ලද අතිකාල සේවාව සඳහා (පැය 37 ½ ක් වෙනුවෙන්) | සරප් - ප්‍රධාන කාර්යාලය<br>ඩබ්.ඩී.ඩී.පී. ජයසේකර මිය | 4707.00 |
| 91 | 2018 මාර්තු මාසයේ හංවැල්ල ප්‍රධාන කාර්යාලය (පැරණි) ජල බිල ගෙවීම. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 1383.45 |
| 92 | 2018 මාර්තු මාසයේ හංවැල්ල ප්‍රධාන කාර්යාලයේ ජල බිල ගෙවීම. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 6067.40 |
| 93 | 2018 මාර්තු මාසයේ හංවැල්ල උප කාර්යාලයේ ජල බිල ගෙවීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 983.25 |
| 94 | 2018 මාර්තු මාසයේ පහත්ගම පොදු වැසිකිලියේ ජල බිල ගෙවීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 516.35 |
| 95 | 2018 මාර්තු මාසයේ හංවැල්ල පොදු වැසිකිලියේ ජල බිල ගෙවීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 4866.80 |
| 96 | 2018 මාර්තු මාසයේ හංවැල්ල සතිපොළ ජල බිල ගෙවීම. ගි.අං - 10/35/982/309/12 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 7001.20 |
| 97 | 2018 මාර්තු මාසයේ හංවැල්ල සතිපොළ ජල බිල ගෙවීම. ගි.අං - 10/35/982/615/11 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 916.55 |
| 98 | 2018 මාර්තු මාසයේ නොදිරන කසල වෙන්කර ඉවත් කිරීමේ මධ්‍යස්ථානයේ ජල බිල ගෙවීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 6173.50 |
| 99 | 2018 මාර්තු මාසයේ හංවැල්ල බස් නැවතුමේ පොදු ජල කරාමයේ ජල බිල ගෙවීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 1250.05 |
| 100 | 2018 මාර්තු මාසයේ එළ හරක් මස් කඩයේ ජල බිල ගෙවීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 1884.94 |

| | | | |
|---|---|---|---|
| 101 | 2018 මාර්තු මාසයේ හංවැල්ල මාළු ලැලි ජල බිල ගෙවීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 393.85 |
| 102 | 2018 මාර්තු මාසයේ ඌරු මස් කඩයේ ජල බිල ගෙවීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 333.50 |
| 103 | 2018 මාර්තු මාසයේ එළු කුකුළු මස් කඩයේ ජල බිල ගෙවීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 1139.73 |
| 104 | 2018 මාර්තු මාසයේ කළුඅග්ගල පොදු වැසිකිලියේ ජල බිල ගෙවීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 449.65 |
| 105 | 2018 මාර්තු මාසයේ කළුඅග්ගල වෙළඳ සංකීර්ණයේ ජල බිල ගෙවීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 1314.82 |
| 106 | 2018 මාර්තු මාසයේ සුදුවැල්ල ආදහනාගාරයේ ජල බිල ගෙවීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 2366.20 |
| 107 | 2018 මාර්තු මාසයේ කළුඅග්ගල වතුර මල ජල බිල ගෙවීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 316.25 |
| 108 | 2018 අප්‍රේල් මාසයේ කළුඅග්ගල පෙර පාසලේ විදුලි බිල ගෙවීම | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 514.50 |
| 109 | 2018 අප්‍රේල් මාසයේ හංවැල්ල පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ විදුලි බිල ගෙවීම | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 404.70 |
| 110 | 2018 අප්‍රේල් මාසයේ හංවැල්ල මහජන පුස්තකාලයේ විදුලි බිල ගෙවීම | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 23592.70 |

| | | | |
|---|---|---|---|
| 111 | 2018 අප්‍රේල් මස හංවැල්ල නිදහස් ආයුර්වේදයේ විදුලි බිල ගෙවීම. | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 843.90 |
| 112 | 2018 අප්‍රේල් මස හංවැල්ල පොදු වැසිකිලියේ විදුලි බිල ගෙවීම. | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 1301.40 |
| 113 | 2018 අප්‍රේල් මස හංවැල්ල නොදිරන කසල වෙන් කිරිමේ මධ්‍යස්ථානයේ විදුලි බිල ගෙවීම. | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 3405.90 |
| 114 | 2018 අප්‍රේල් මස හංවැල්ල දිරන කසල වෙන් කර ඉවත් කිරිමේ මධ්‍යස්ථානයේ (බේල් මැෂිම) විදුලි බිල ගෙවීම. | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 1045.20 |
| 115 | 2018 අප්‍රේල් මස හංවැල්ල සතිපොළ විදුලි බිල ගෙවීම. ගි.අ 4608126709 | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 14269.90 |
| 116 | 2018 අප්‍රේල් මස හංවැල්ල සතිපොළ විදුලි බිල ගෙවීම. ගි.අ. 4692418818 | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 7346.35 |
| 117 | 2018 අප්‍රේල් මස හංවැල්ල සතිපොළ විදුලි බිල ගෙවීම. ගි.අ. 4615106807 | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 917.10 |
| 118 | 2018 අප්‍රේල් මස හංවැල්ල නව වෙළද සංකීර්ණයේ (බිම් මහල) විදුලි බිල ගෙවිම | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 2747.10 |
| 119 | 2018 අප්‍රේල් මස හංවැල්ල නව වෙළද සංකීර්ණයේ (උඩු මහල) විදුලි බිල ගෙවිම | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 3021.60 |
| 120 | 2018 අප්‍රේල් මස අංක 03 එළු කුකුළු මස් කඩයේ විදුලි බිල ගෙවීම. | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 972.00 |
| 121 | 2018 අප්‍රේල් මස හංවැල්ල පැරණි වෙළද සංකිර්ණයේ විදුලි බිල ගෙවීම. | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 240.00 |

| | | | |
|---|---|---|---|
| 122 | 2018 අප්‍රේල් මස හංවැල්ල වෙළඳ සංකීර්ණයේ ඌරු මස් කඩයේ විදුලි බිල ගෙවීම. | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 715.80 |
| 123 | 2018 අප්‍රේල් මස හංවැල්ල උත්සව ශාලාවේ විදුලි බිල ගෙවීම. | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 3717.00 |
| 124 | 2018 අප්‍රේල් මස සුදුවැල්ල ආදාහනාගාරයේ විදුලි බිල ගෙවීම. | මහජන බැංකුව<br>ලංකා විදුලිබල මණ්ඩල ගිණුම. | 2015.10 |
| 125 | සභාවේ සේවය කල පහත නම් සඳහන් අයගේ විශ්‍රාම වැටුපෙන් වැඩිපුර ගෙවන ලද සේවක ණය මුදල ආපසු ගෙවීම. | එස්. සරස්වතී මිය 4,276.64<br>ඩබ්. සුනිල් මයා 3300.00<br>එම්.ජී ගාමිණී මයා 1400.00 | 8976.64 |

## 03. ඇස්තමේන්තු සලකා බැලීම.

පහත සඳහන් ඇස්තමේන්තු අනුමත කර අදාල ව්‍යාපෘති ආරම්භ කිරිම සඳහා බලය ලබා ගැනීමට ඉදිරි මහා සභාවට යෝජනා ඉදිරිපත් කිරිම සුදුසු බව කාරක සභාව තීරණය කරන ලදී.

| අනු අංක | ව්‍යාපෘතිය | මුදල රු. |
|---|---|---|
| 01 | හංවැල්ල වෙළඳ සංකීර්ණයේ ( බස් නැවතුම්පල පැත්ත) කාණුව කොන්ක්‍රීට් කර ආවරණ යෙදීම. | 553,518.00 |
| 02 | නැණසල ගොඩනැගිල්ලේ බිම් මහලේ විදුලි පද්ධතිය සකස් කිරිම. | 181,850.00 |
| 03 | වේරගොල්ල ද ෆිනැන්ස් පටුමග තාර දමා සංවර්ධනය කිරිම.<br>2018/DCB/UG/SEE/02 | 230,200.15 |
| 05 | පාදුක්ක ජයන්ති මාවත ජය පෙදෙස දෙසට ඇති මාර්ගය කොටසක් කොන්ක්‍රීට් කිරිම. | 532,920.48 |

| | | |
|---|---|---|
| 06 | පෙර පාසල් කාර්යසාධන තරගාවලියේ ප්‍රථම ස්ථානය ලබා ගත් දෙහිවල මහා නගර සභා පෙර පාසල නිරීක්ෂණ චාරිකාව සඳහා | 26000.00 |
| 07 | ආහාර පරිහරණ ආයතන හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සංග්‍රහ වියදම් | 17000.00 |
| 08 | බෝපේ සියඹලාව පාර කැඩී ඇති රුදවුම් බැම්ම කොටස ඉදිකිරීම. | 800,000.00 |
| 09 | කහහේන උප කාර්යාලයේ වහලය අළුත්වැඩියා කිරීම. | 129,247.63 |

## **04. සේවක ණය**

2018 අප්‍රේල් 17 වන දින පැවති මහා සභාවේ තීරණ අංක 05 – (06) යටතේ පවරන ලද අනුමත කිරීමේ බලය අනුව පහත නම් සඳහන් සේවකයින්ගේ ආපදා ණය මුදල් ගෙවීම අනුමත කිරීමට කාරක සභාව තීරණය කරන ලදී.

| අනු අංකය | නම | ණය මුදල රු. | ගෙවන මුදල රු. |
|---|---|---|---|
| 1 | ඩබ්.ඩී. සුමතිපාල මයා | 250,000.00 | 74,775.00 |
| 2 | කේ. විමල් ශාන්ත මයා | 200,340.00 | 53,310.00 |
| 3 | ඩබ්.එල්.ඩී.එස්.පී. කරුණාරත්න මිය | 250,000.00 | 41,930.00 |
| 4 | ආර්.ඒ. සේනාධීර මයා | 231,260.00 | 53,120.00 |
| 5 | පී.ඩී.ඩී. චතුරංග මයා | 196,380.00 | 50,140.00 |
| 6 | බී.එච්.පී. ප්‍රියන්ත මයා | 227,200.00 | 110,280.00 |
| 7 | ටී.කේ. සුනිල් ශාන්ත මයා | 231,480.00 | 231,480.00 |
| 8 | ඩබ්.ඩී.ඩී.පී. ජයසේකර මිය | 250,000.001 | 55,000.00 |
| 9 | මහේෂ් නිශ්ශංක මයා | 216,500.00 | 56,970.00 |
| | එකතුව | 2,053,160.00 | 727.005.00 |

**05.සාකච්ඡා සටහන්.**

01. හංවැල්ල නගරයේ මේ වන විට අනවසරයෙන් ඉදි කර ඇති කඩ විශාල ප්‍රමාණයක් දක්නට ලැබෙන බවත් මේ නිසා සිදුවන අපහසුතාවයන් පිළිබඳවත් කාරක සභාවට දිර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් වු අතර, මෙම අනවසර ඉදිකිරිම් සියල්ල 2018.05.02 දින කඩා ඉවත් කරන බව වැඩිදුරටත් අදහස් දක්වමින් ලේකම්තුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

02.සීතාවක ප්‍රාදේශීය සභාව සතු ගලි බවුසරය සඳහා අය කරන ලද ගාස්තුව පෞද්ගලික ගලි බවුසර සඳහා අයකරන ගාස්තුවටද වඩා වැඩි බවට ගරු කාරක සභික මංජුල වීරරත්න මැතිතුමා විසින් කාරක සභාවට කරුණු ඉදිරිපත් කළ අතර, දෛනිකව සේවා සැපයිය නොහැකි මට්ටමට ගලි බවුසරය ඉතා අබලන් තත්වයේ පවතින බවත් සභාව සතු පොදු වැසිකිලි දෛනිකව අපද්‍රව්‍ය ඉවත් කිරිමට සිදු වන බැවිනුත් යන කාරණ හේතු කොටගෙන ගලිබවුසර ගාස්තු ගාස්තු ඉහළදැමීමට සිදු වු බවත් ලේකම්තුමා විසින් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින් පවසා සිටින ලදී. දෛනිකව සේවා සැපයීම සීමා කර ගලි බවුසරයේ ගාස්තුව සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ඉදිරි කාරක සභාවේදී නැවත සාකච්ඡා කිරිමට තීරණය කරන ලදී.

03.සීතාවක ප්‍රාදේශීය සභාව සතු ගලගෙදර ආදාහනාගාරය සඳහා මෘත දේහ භාර ගැනීමේ කාල සීමාව ප.ව.2.00, ප.ව.5.00 හා ප.ව.7.00 ලෙස පැවතියද ප.ව.2.00 ට මෘත දේහ බාර දීමේදි යම් යම් ගැටලුකාරි තත්වයන්ට මුහුණ පෑමට සිදු වන බැවින් එම කාල සීමාව වෙනස් කරන ලෙස කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා විසින් කරන ලද ඉල්ලිම සම්බන්ධයෙන් දිර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කර එම කාල සීමාව සංශෝධනය කිරිම පිළිබඳව ඉදිරි කාරක සභාවේදී නැවත සාකච්ඡා කිරිමට තීරණය කරන ලදී.

04.සීතාවක ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩාංගන ලබා ගැනීමේදි ඒ සඳහා වැඩි ගාස්තුවක් ගෙවිමට සිදු වන බවත් එම ක්‍රීඩාංගන වල පහසුකම් නොමැති බවටද ගරු කාරක සභික උපුල් රූපසිංහ මැතිතුමා විසින් කාරක සභාවට කරුණු ඉදිරිපත් කරන ලද අතර මේ සම්බන්ධයෙන් ඉදිරි කාරක සභාවේදි සාකච්ඡා කිරිමට තීරණය කරන ලදී.

අද දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීමේදී ගන්නා ලද ඉහත සඳහන් තීරණ ඇතුළත් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාවට එකග වෙමින් පහත අත්සන් තබමි.

1. ගරු කාරක සභා සභාපති - ජී. ජයන්ත රෝහණ මැතිතුමා ..............................................
2. ගරු කාරක සභික - එස්.ඩී. මංජුල ප්‍රදිප් කුමාර් මැතිතුමා. ..............................................
3. ගරු කාරක සභික - චන්දන මුදුන්කොටුව මැතිතුමා. ..............................................
4. ගරු කාරක සභික - කේ.ඒ විමල් ප්‍රසන්න මැතිතුමා. ..............................................
5. ගරු කාරක සභික - ලියනගේ චන්දන කුමාර මැතිතුමා. ..............................................
6. ගරු කාරක සභික - යසරු දෙවන්මිණ රාජපක්ෂ මැතිතුමා. ..............................................
7. ගරු කාරක සභික - ජයන්ත රණවක මැතිතුමා. ..............................................
8. ගරු කාරක සභික - මංජුල ධම්මික වීරරත්න මැතිතුමා. ..............................................
9. ගරු කාරක සභික - එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා. ..............................................
10. ගරු කාරක සභික - සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා. ..............................................
11. ගරු කාරක සභික - උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා. ..............................................
12. ගරු කාරක සභික - ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා. ....................................
13. ගරු කාරක සභික - පී.ඒ ප්‍රදීප් කුමාර් මැතිතුමා. ..............................................
14. ගරු කාරක සභික - ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා. ..............................................
15. ගරු කාරක සභික - එස්. චන්දන සුරියආරච්චි මැතිතුමා. ..............................................

කාරක සභාවේ වැඩ කටයුතු ප.ව. 05.00 ට නිමාවට පත් විය.

2018.04.27 වන දින,

සීතාවක ප්‍රාදේශීය සභා කමිටු ශාලාවේදී.